පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**Diploma in Management and Development – First Semester Examination – February 2020**

## DM 011-කළමනාකරණ මූලධර්ම

උපදෙස්:

- කාලය පැය 3 යි
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හයක් (06) පමණක් අඩංගු වේ.
- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න
- මුළු ලකුණු 60 යි

දිනය 15/03/2020 කාලය 1.00pm-4.00 pm

1.
(i) "කළමනාකරණය යනු එකිනෙකට සම්බන්ධ වූ සහ එකිනෙකට පරායත්ත වූ කාර්යයන් වල ක්‍රියාවලියකි". පැහැදිලි කරන්න. (ලකුණු 04)
(ii) විවිධ කළමනාකරණ මට්ටම්වල කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
(iii) හෙන්රි මින්ට්ස්බර්ග්ට අනුව කළමනාකරුවෙකුගේ තීරණාත්මක කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 04)
(iv) සඵලදායී කළමනාකරුවෙකු වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සාකච්ඡා කරන්න. (ලකුණු 04)

**(මුළු ලකුණු 15)**

2.
(i) එෆ්.ඩබ්ලිව්. ටේලර් විසින් හඳුන්වා දුන් විද්‍යාත්මක කළමනාකරණ මූලධර්ම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
(ii) ඔබේ සංවිධානයේ, කළමනාකරණයේ අවස්ථානුකූල ප්‍රවේශය පිළිබඳ මූලික අදහස් ඔබට අදාළ කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)
(iii) හෙන්රි ෆයොල් විසින් හඳුන්වා දී ඇති ඕනෑම කළමනාකරණ මූලධර්ම තුනක් තෝරා ඔබේ සංවිධානයේ සංවර්ධනය සඳහා ඒවා භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

**(මුළු ලකුණු 15)**

3.
(i) උදාහරණ සමඟ ව්‍යාපාරික පරිසරයේ උප පරිසරයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)
(ii) ශ්‍රී ලංකාවේ සංවර්ධන අවශ්‍යතා සපුරාලන මෙවලමක් ලෙස ආයතනික සමාජ වගකීම්වල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) සැබෑ උදාහරණයක් භාවිතා කරමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර සාකච්ඡා කරන්න.
(ලකුණු 07)
**(මුළු ලකුණු 15)**

4.
(i) සැලසුම් මට්ටම් තුන ඒවායේ ප්‍රධාන ලක්ෂණ සමඟ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
(ii) SWOT විශ්ලේෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? සහ සැලසුම් ක්‍රියාවලිය සඳහා එහි කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)
(iii) යාන්ත්‍රික හා ජීව ආයතනික ව්‍යුහයේ ලක්ෂණ සසඳන්න. (ලකුණු 03)
(iv) විමධ්‍යගතකරණයේ වාසි සහ අවාසි ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)
**(මුළු ලකුණු 15)**

5.
(i) 'මට්ටමේ 5 නායකත්ව ධූරාවලිය' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කර නවීන සංවිධාන සඳහා එහි වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 06)
(ii) කළමනාකරුවන්ට තම සේවකයින් පෙළඹවීම සඳහා ද්වි සාධක අභිප්‍රේරණ න්‍යාය භාවිතා කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 04)
(iii) ඔබේ ආයතනයේ සේවකයින් සංවර්ධනය කිරීම සඳහා අභිප්‍රේරණය භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)
**(මුළු ලකුණු 15)**

6.
(i) සංවිධානයක සන්නිවේදනයේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
(ii) විධිමත් හා අවිධිමත් සන්නිවේදනය අතර වෙනස පැහැදිලි කරන්න (ලකුණු 03)
(iii) පාලනය කිරීමේ ක්‍රියාවලිය පියවර උදාහරණයකින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)
(iv) ඔබේ සංවිධානය භාවිතා කරන මූල්‍ය හා මූල්‍ය නොවන පාලන ක්‍රම පැහැදිලි කරන්න.
(ලකුණු 04)
**(මුළු ලකුණු 15)**

*********************************************************************